# "වලව්වට වැසි ඇවිත්" රසාස්වාදය

අසූව දශකයේ මුල් භාගය තුළ කාව්‍යකරණයට පිවිසි නන්දන වීරසිංහ කවියා නූතන සිංහල කවිය අර්ථ සම්පන්න වෙනසකට භාජනය කළ කවියකු වශයෙන් හැඳින්විය හැකි ය. සිය පළමු කාව්‍ය සංග්‍රහය වන "ගිංගඟේ විලාපය" කෘතියේ සිට ම පාඨකයා තුළ ප්‍රබල කම්පනයක් ඇති කරවන්නට ඓතෙම සමත් විය. පාඨක අවධානය මතු නොව විචාරක අවධානය ද නිබඳව ම ලැබූ ඔහු බුන්කා සම්මානය සහ රාජ්‍ය සම්මාන කිහිපයකිනුත් අවශේෂ සම්මාන රැසකිනුත් පිදුම් ලැබූ කවියෙකි.

නිර්දිෂ්ට "වලව්වට වැසි ඇවිත්" පද්‍ය පන්තිය ඔහුගේ "කිරි සුවඳැති රාත්‍රිය" නම් කෘතියේ අන්තර්ගත වේ. රචකයාගේ අභිප්‍රාය වන්නේ මෙරට සාමාන්‍ය ගැමි ජනතාව පීඩනයට පත් කළා වූ වැඩවසම් රදළ සංස්කෘතියේ බිඳවැටීමත් නූතන සම්ප්‍රදායේ මූලබීජ රෝපණය වීමත් අතර සංක්‍රාන්තිමය අවස්ථාවේ ලක්ෂණ මාත්‍රයක් පාඨක රසිකයාගේ හමුවට ගෙන ඒමයි. කවියා සිය අභිමතාර්ථය සාධනය කර ගැනීම සඳහා වස්තු විෂය කරගන්නේ ක්‍රමයෙන් අභාවයට යන පෞරාණික වලව්වක් සහ එහි ගෘහ භාණ්ඩත් කතකයා, ගැමි තරුණයන් වැනි චරිත කිහිපයකුත් පසුබිම් වන ග්‍රාමීය වටපිටාවත් ය.

කවිය අපූර්ව වූත් සූක්ෂම වූත් කලාංගයකි. වෙනත් කලා මාධ්‍යයන්ට සාපේක්ෂ ව කවියට ලැබෙන ඉඩකඩ සීමිත ය. එම සීමිත ඉඩකඩ තුළින් කවියා සිය ප්‍රකාශනය පාඨකයා වෙත සන්නිවේදනය කළ යුතු වේ. එය හුදු ප්‍රකාශනයක් ද නොව අර්ථපූර්ණ භාවපූර්ණ ප්‍රකාශනයක් විය යුතු ය. කවියා ඒ සඳහා මෙවලම් වශයෙන් කාව්‍යෝපක්‍රම නැතිනම් රචනෝපක්‍රම යොදා ගනී. මෙහිදී අප කවියා යොදාගන්නා භාෂාව, ආකෘතිය, විරිත, සංකේත භාවිතය, අනුප්‍රාසය, වාග් චිත්‍ර මැවීම, ඖචිත්‍ය, සංක්ෂිප්ත බව සේම කවියා තුළ තිබූ කාව්‍යමය ශික්ෂණය ද රසෝත්පාදන කාර්යයෙහිලා ඉවහල් වී දැයි බලමු.

sameera

කවියා භාවිතා කරන භාෂාව වර්තමාන ව්‍යවහාර භාෂාවත් චිරන්තන ගද්‍ය පද්‍ය භාෂාවත් කට වහරත් යන ත්‍රිත්වයෙහි ම සංකලනයෙන් සකසා ගත් ධ්වනිපූර්ණ ගුණයෙන් ද අනූන එකකි. එය ඉතා රසවත් ය. කවියාට ම ආවේණික වූ හැඩරුවක් ද ඒ තුළ ගැබ්ව පවතී.

"පරපුරක කළු දුඹුල් කඩා පිරිසිදු කරන
සෙවල කෑ උළු පිහිලි පිහිලි සෝද සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිතින
මෙන්න දැන් දොරකඩට ඇවිත් තිල් දිය ඉසින"

කථකයා අයත් පරම්පරාවේ කළු දුඹුල්, සෙවල ආදියෙන් අපවිත්‍ර තැන් බොහෝ ය. නූතන ප්‍රවාහය තුළ ඒවාට ඉඩක් නැත. සියල්ල ශුද්ධ පවිත්‍ර කිරීමට මෙන් වැසි සමය එළඹ ඇත. කතකයා ද එය පිළිගැනීමට විරුද්ධත්වයක් නොදක්වයි. මෙකී ධ්වනිය පෝෂණය කිරීමෙහිලා කවියාගේ භාෂා භාවිතාව සමත් ය. දූදුරු වුණු, මහසල් කුලයෙ, දනන්, දස දිගින් බඳු චිරන්තන භාෂාවේ යෙදුම් ද මාන්දම්, අහුමුළු, විය ගසින් ආදී කට වහරේ එන යෙදුම් ද අනෙකුත් සෑම තැනකම පාහේ බහුලව යෙදෙන වර්තමාන භාෂාවත් සම්මිශ්‍රව යොදා ගෙන තනා ගත් කවි බස ඒ සඳහා උපයුක්ත ය.

කවියා ස්වකීය කාව්‍ය ආකෘතිය ලෙස යොදා ගන්නේ එලිසමය සුරකි සිව්පද ආකෘතියයි. වලව්වේ පෞරාණික ගූඪ ස්වරූපය ඉස්මතු වන සේ සැහැලි විරිතේ දිගුවක් විරිත වශයෙන් භාවිතා කරයි. ඉන් ශබ්ද රසය මතු නොව අර්ථ ග්‍රහණය සඳහා ද මහගු පිටුවහලක් ලැබේ.

"සෙවල කෑ උළු පිහිලි සෝද සෝදා හරින"

"අලුත් වැස්සෙන් එ ගිනි නිවි නිවී සංසිඳෙන"

නිවි නිවී, සෝද සෝදා යන මිශ්‍ර ක්‍රියා පද පුනරුච්චාරණය වන සේ යෙදීමෙන් උක්ත පද්‍ය පාද අනුප්‍රාසයෙන් රසවත් වනවා සේම

www.Artsapi.lk

ඒවාට සජීවී බවක් ද එක් වී ඇත. පුනරුක්තිය ගද්‍යයේ දී දෝෂයක් ලෙස සැලකුව ද මෙහිදී පද්‍ය පන්තිය ඔපවත් කිරීමට දායක වී තිබේ.

කවියා භාවිතා කරන සංකේත, උපමා ආදිය ද පද්‍ය පන්තිය අර්ථ රසයෙන් පරිපූර්ණත්වයට පත් කරයි. කාව්‍ය පුරාම ව්‍යංගාර්ථ නංවන්නා වූ සංකේත බහුල ය.

"ඇතුළු ගැබ නොදුටු අහුමුලු සොයා හඹා යන
අලුත් වැහි හැළි වළං උතුරුවා ඇද හැලෙන
මහ පෙට්ටගම හායි ගා මහළු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන"

වලව්ව සාමාන්‍ය ගැමි ජනතාවගෙන් වියුක්ත ව පැවති ස්ථානයකි. නමුත් අලුත් වැස්ස එම සීමා අතික්‍රමණය කරමින් සෑම අස්සක් මුල්ලක් පාසා ම ව්‍යාප්ත වේ. පළමු දෙපදයෙන් සංකේතවත් වන්නේ එකී ආක්‍රමණයයි. මහ පෙට්ටගම කතකයාගේ පරම්පරාවේ විභූතිය හඟවන ප්‍රබල සංකේතයකි. නමුත් දැන් එය කල් ඉකුත් ව ගොසිනි. නූතන ප්‍රවාහය හමුවේ එය උපහාසයට ලක්වේ. "හායි" යන අනුකරණයෙන් එය ද නූතනත්වයට විවෘත වේ. වලව්වේ ධනය, බලය හමුවේ ගැමියාගෙන් උදුරාගත් ඔප්පුවල අකුරු ද වැසි දිය වැටී එකිනෙක වියැකී යයි.

වාග් චිත්‍ර දනවීම අතින් ද කවියා තම නිර්මාණය වින්දනයේ ඉහළ ම තලයට ඔසවා තබයි. මතු දැක්වෙන පද්‍ය තුළින් පළවන්නේ කවියා කාව්‍යකරණය විෂයෙහි පළ කළ පරිණත බවයි.

"එදා දස දිගින් වැඩි සුළඟට ද වැසු දොරින
ඇතුළුවෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලව්වේ විය ගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන"

මෙතෙක් කල් දස දෙසින් ගැමියන්ගේ වේදනාත්මක ඉල්ලීම් නැමැති සුළං හැමුව ද ඒ වෙනුවෙන් වලව්වේ දොරටු විවර වූයේ

Sameera

නැත. නමුත් නූතන ප්‍රවාහය එම දොරටු විවර කරවන්නට සමත් වෙයි. කතකයාට ඉන් ගැමි දනන්ගේ වේදනාත්මක ස්වරූපය දකින්නට අවකාශය ලැබේ. විය ගසේ බැඳි ගවයන් මෙන් ඔවුහු වලව්වේ කටයුතු වලට බැඳී සිටියෝ වෙති. දන් රිසිසේ ස්වකීය කටයුතු කටයුතු කර ගැනිමට එවුනට අවස්ථාව ලැබේ.ගැමි තරුණයින්ගෙන් ඔවුන් හා එක්වන ලෙස කතකයාට ද ඇරයුම් ලැබේ. උක්ත සිදුවීම් පෙළ චිත්‍රපටයක රූපරාමු පෙළක් සේ පාඨක සිත තුළ චිත්‍රණය කරවන්නට කවියා සමත් වේ. රදළ පරපුර කෙරෙහි ද්වේෂ සහගත නොවී මනා සංයමයකින් විරචිත නිසාවෙන් ම ගැමි දනන් වෙත පාඨකයාගේ සානුකම්පාවත් රදළ පරපුර අරභයා සියුම් උපහාසයකුත් ජනිත වේ.

එනයින් නන්දන වීරසිංහ කවියාගේ වලව්වට වැසි ඇවිත් පද්‍ය පන්තිය රසිකයාගේ භාව මණ්ඩලය සේම බුද්ධි මණ්ඩලය ද ප්‍රභාමත් කරන්නා වූ සාර්ථක නිර්මාණ කාර්යයක් මැයෙන් අගය කළ හැකි ය. කවියාගේ පුද්ගලික ජීවන දෘෂ්ටිය වන්නේ වැඩවසම් ක්‍රමය අහෝසි විය යුතු බවයි.

සැකසුම: ආර් .එම්. සමීර රන්ජන් බණ්ඩාර (කොළඹ විශ්වවිද්‍යාලය)

Sameera